වාර්ගිකත්වය මත සිදුවන කොන්ක්‍රීම් මුලිනුපුටා දැමීමේ ජාත්‍යන්තර දිනය පසුගිය දින (මාර්තු 21) යෙදී තිබිණි. මාධ්‍ය තුළ අදාළ නොවන සෘණාත්මක සන්දර්භයන් තුළ වාර්ගිකත්වය ඉස්මතු කිරීම කෙතරම් සිදුවී ඇතිදැයි සොයා බැලීමට අපි එය ප්‍රස්තුතයක් කොට ගත්තෙමු.

යම් පුවතකට සෘජුවම අදාළ නොවන අවස්ථාවන්හිදී වාර්ගිකත්වය සඳහන් නොකළ යුතු බව, මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන් හි දැක්වේ. පුවතට අදාළ නොවන සෘණාත්මක සන්දර්භයන් තුළ වාර්ගිකත්වයන් ඉස්මතු කොට දැක්වීමේ ගැටළුව වන්නේ, ඒ ඔස්සේ එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඉස්මතු වීමට ඇති හැකියාවයි.

2020 සහ 2021 වසර වල තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ මෙසේ අදාළ නොවන අවස්ථාවන්හිදී වාර්ගිකත්වය ඉස්මතු වූ වාර ගණන පහත දත්ත සටහනෙන් දැක්වේ.

එහිදී නිරීක්ෂණය කළ හැකි වන්නේ, 2020 පළමු අඩ වසරට සාපේක්ෂව දෙවන අඩ වසර තුළ මෙම ආචාර ධර්මය කඩවීම අඩු වී තිබුණත්, ඉන් අනතුරුව 2021 වසර තුළ එය සැලකිය යුතු සෙයින් වැඩි වී ඇති බවයි.

ඔබේ අදහස?